නමෝ බුද්ධාය


දාහ නව වෙනි වෙළුම
ආරම්භය: 2001-07-05

මාසික ධර්ම සංග්‍රහය අංක: 184

ශ්‍රී. බු. ව. 2559 | 2015 සැප්තැම්බර් 27 | බිනර කළාපය


# නිවන්මග අවුරන පස්කම් රස විඳුම


වයඹ පළාතේ සුවිසි පත්තුවේ උප ප්‍රධාන සංඝනායක ධර්ම කීර්ති ශ්‍රී
**අතිපූජ්‍ය මංගෙදර සිරිරතන නා හිමිපාණන් වහන්සේ විසිනි**


නමෝ තස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස ///

යෝ කාමේ පරිවජ්ජේති - සප්පස්සේව පදාසිරෝ
සෝ ඉමං විසත්තිකං ලෝකේ - සතෝ සමතිවත්තති

(මජ්ඣිම නිකාය)

සැදැහැවත් පින්වතුනි,

යමෙක් ඝෝර විෂ ඇති සර්පයෙකු ගේ හිස නොමැඩ අල්වන්නාසේ ප්‍රඥාවන්තයා මහ විපත ට කරුණු වන හලාහල විෂක් බඳු වූ පංච කාම ගුණයන් හාත්පසින්ම දුර ලන්නේ ය.

ලොව්තුරා ශාන්තිනායක ලෝක ශිවංකර අමා මෑණී බුදුපියාණන් වහන්සේ මේ භයංකාර සසරින් මිදීම සඳහා ප්‍රියංකර යයි දේශනා කොට වදාළ ගාථා ධර්මයක් මාතෘකා කළේ. එය ඇතුලත් වන්නේ සූත්‍රපිටකයට අයත් මජ්ඣිම නිකායේ මූලපණ්ණාසකයේ 13 වැනි සූත්‍රයටයි.

එක් සමයක අප තථාගත බුදුපියාණන් වහන්සේ සැවැත් නුවර ජේතවනාරාමයෙහි වැඩ වදාරණ කල දිනක් භික්ෂූන් වහන්සේ පිඩු පිණිස විහාරයෙන් නික්මී නුවරට කල් ඇතිව පැමිණියහ. එහෙත් අන්‍යතීර්ථක ආරාමයකට ගොස් දැක සතුටුව පිළිසඳර කථා කොට පැනවූ ආසන මත වැඩ හුන් භික්ෂූන් වහන්සේට ඔවුහු මෙසේ කීවාහු ය. ඔබ වහන්සේගේ ගෞතම තථාගතයන් වහන්සේ කාමයන්ගේ දුරලීම උගන්වයි. අපි ද උගන්වමු. රූප හැඟී සරණ ක්‍රමය ද දේශනා කරයි. අපි ද එසේ කරමු.වේදනාවන්ගේ ප්‍රහාණ ක්‍රමය ද උගන්වයි. අපි ද එසේ කරමු. මේ නිසා ගෞතමයන් වහන්සේගේත් - අපගේත් අතර ඇති වෙනස කුමක්ද? වෙනස් වූ අදහස කුමක්ද? යි විචාළේය.

එකල්හි භික්ෂූන් වහන්සේ ඒ කථාව සතුටින් නොපිළිගෙන ප්‍රතික්ෂේප ද නොකළාහු. එහි අදහස බුදුරජාණන් වහන්සේගෙන් දැන ගන්නෙමුයි නැගිට නුවරට පිඩු පිණිස වැඩියාහුය. විහාරයට ගොස් වළඳා සවස් කාලයෙහි බුදුරජාණන් වහන්සේට මේ කාරණය සැල කළාහු ය. එසේ කියන අන්‍යතීර්ථක පරිබ්‍රාජකයන්ට පිළිතුරු වශයෙන් මෙසේ කිව යුතුව ඇත.

රස විඳ ගැනීම කවරේද? කාමයන්ගේ දෝෂය කවරේද? කාමයන්ගෙන් නිදහස්වීම කවරේද? මේවාට පිළිතුරු දෙන්නට ඔවුන්ගේ දුර්වල ඥානයට විෂය නොවේ. අවිෂයවේ. මේ ලෝකයේ යම් කෙනෙක් මේ ප්‍රශ්නයට මේ ශාසනයෙන් නොඅසා විසඳුම් ප්‍රකාශ කිරීමට සමත් කෙනෙක් නැති බව වදාළ සේක.

**කාම ආස්වාදය**

කාම ගුණයෝ 5 දෙනෙකි. ඇසින් දැක්ක යුතු, යහපත් යයි සිතා සේවනය කළ යුතු දැක ආලය වඩන ස්ත්‍රී පුරුෂ රූපයෝ ද, කණින් අසා දතයුතු වූ ස්ත්‍රී පුරුෂ ශබ්දයෝ ද, ගන්ධයෝද රසයෝ ද, ස්පර්ශයෝ ද. යනුවෙනි.
පංචකාම ගුණයෝ දෙවැදෑරුම් වෙති.වස්තු කාම .ක්ලේශ කාම යනුවෙනි.කාමශාවන්ට ඉලක්ක වන ප්‍රියංකර කාමණීය රූපාදි වස්තූන් කෙරෙහි ක්ලේශකාමයන් හැසිරවීම නිසා යම් සැනසීම් රස විඳ ගැනීම් ආදි යම් සැපයක් වේද ඒ සතුට කාමයන්ගේ ආස්වාදයයි.
ඉහත කී වස්තු කාමයෝ හැම දෙනාටම මනාප ද ප්‍රිය ජනක ද නොවෙති.කෙනෙකුට අප්‍රිය ආරම්මණ වෙති. ශබ්දාදිය ද, එසේමය. ලොව්තුරු බුදුපියාණන් වහන්සේ කාම ආස්වාදය ඒ ඒ සත්වයන්ගේ මනාපය කෙලවර කොට ඇත්තේය යි වදාළ සේක.

මනාප පරියන්තං චෝ භික්ඛවේ කාමානං අස්සාදං වදාමි

යමෙක් ජීවිකාව පිණිස දිවා රෑ නොබලා වැඩ කරන විට අව්, වැසි, සීත, උෂ්ණ, සා පිපාසාදි දුක් පීඩා ද , කායික හා චිත්ත පීඩා වේත් නම් ඒ සියල්ල ද කාමයන් නිසා හට ගන්නා උවදුරු වෙයි. තමා විසින් ම විඳිය යුතු මේ දුක් රාශිය කාමයම හේතු ප්‍රත්‍යය කොට හට ගන්නේය. ඊළඟට වීර්යයෙන් හා දුකසේ ලත් භෝග සම්පත් ආරක්ෂා කිරීම පිණිස දුක් දොම්නස් පීඩා විඳින්නේ ය.

රජයෙන් , ගින්නෙන්, ජලයෙන් හෝ අප්‍රිය අමනාප සදාතිහු නොගන්නේ නම් මැනවයි දුක් විඳින්නේ ය.ඒවා විනාශ වුවහොත් දුකින් පීඩිතව මුළාවට හෝ උමතුවට පත්වන්නේය. මෙය ද කාමයෙනි ආදීනවයි. කාමයන් නිසාම එකිනෙකා විවාද කරයි. කෝලාහල කරයි.ඒ නිසාම පහරදීම් වලට ද මරණයට ද පත්වෙති.මේ කාමයන්ගේ ආදීනවයි. තව ද කාමයන් නිදාන කොට පස්පව් ද දස අකුසල් ද සිදු කරති.මරණින් මතු සැපයෙන් නැති අපායවල උපදින්නාහුය.

**කාමයන්ගේ නිස්සාරණය**

කාම විපත්තින්ගෙන් මිදීම කාමයන්ගේ නිස්සාරණයයි.මෙලොව කාමයන් ට විරුද්ධව පිළිපදිමු යයි  කියන පිරිස බොහෝය. එහෙත් කාම විභාගයවත්, ආස්වාදයවත්, ආදීනවත්, ප්‍රහාණ ක්‍රමයවත් නොදන්නාහුය. කාමයන්ගේ නිස්සාරණය හෙවත් නිර්වාණ ශාන්තිය නම් එයින් මිදී සැනසීමයි.

ස්ත්‍රී පුරුෂ රූප කෙරෙහි කාමාස්වාදි වශයෙන් පවත්නා මනා වර්ණ ඇති රූපයන් ඇසුරු කළ රූප කාම තෘෂ්ණාව ද, කථා, ගීතිකා ආදි කාමුක මධුර ශබ්ද කෙරෙහි කාමාස්වාද වශයෙන් පවතින ශබ්දකාම තෘෂ්ණාව ද ,ශරීර ගන්ධයන් කෙරෙහි ඇසුරු කළ ගන්ධකාම තෘෂ්ණාව ද, ශරීර සම්බන්ධ රස කෙරෙහි පවත්නා රස කාම තෘෂ්ණාව ද, ස්පර්ශ කෙරෙහි පවත්නා පහස නිමිති කොට ස්පර්ශ කාම තෘෂ්ණාව ද යන මේවා පංචකාම ගුණයෝය.

මෙලොව සැම දෙනා යථෝක්ත පංච කාම කෙරෙහි ඇලුනාහු නමුත් ඇතැම් කෙනෙක් රූප කාම තෘෂ්ණාව ද බලවත් කොට ඇත්තාහ. ශබ්ද කාමය ද, ගන්ධ කාමය ද, රස කාමය ද, ස්පර්ශ කාමය ද බලවත් කොට ඇත්තාහ.

මේ එක එක තෘෂ්ණාව පවා විපත්තින්ට හෝ මරණයට හෝ මරණය සමාන දුකට හෝ විපතට කරුණු වෙති. එසේ නම් එකී පසම එක් වූ තැන ඇති වන දුක්ඛ විපත් රාශිය ගැන කියනුම කවරේද?

අප්පසාදා කාමා වුත්තා භගවතා බහු දුක්ඛා බහු පායාසා ආදීනවෝ එතථභීයෝ පංචකාමයෝ ස්වල්ප වූ ආස්වාද හෙවත් ඉතා සුලු සැප විඳුම් ස්වභාව කොට ඇත්තාහුය. බොහෝ දුක් ඇත්තාහ, වෙහෙස ඇත්තාහ, දොස් ඇත්තාහ, යයි බුදුරජාණන් වහන්සේ විසින් වදාරණ ලද්දේය.

කාමය පිළිබඳ උපමා

1. අට්ඨිකංඛලූපමා කාමා - කාමයෝ ඇටකටුවක් බඳුය. 2. මංසපේසූපමා කාමා - කාමයෝ මස් වැදැල්ලක් බඳුය. 3. තිණුක්කූපමා කාමා - කාමයෝ තණසුළක් බඳුය. 4.අංගාරකාසූපමා කාමා - කාමයෝ දිළිසෙන අඟුරු වලක් බඳුය. 5. සුපිනකූපමා කාමා - කාමයෝ සිහිනයක් බඳුය. 6. යාචිත කූපමා කාමා -කාමයෝ ණයට ගත් දෙයක් බඳුය. 7. රුක්ඛඵලූපමා කාමා - කාමයෝ ගසින් වැටුණු ගෙඩියක් බඳුය. 8. අසිසූනූපමා කාමා - කාමයෝ මස් කපන අවියක් බඳුය. 9. සත්තිසූලූපමා කාමා - කාමයෝ යවුල් බඳුය. 10. සප්පසිරූපමා කාමා - සර්ප හිසක් බඳුය.

කාමයෝ ස්වල්ප වූ ආස්වාද රස ඇති හෙයින් ඇට කටුවට බඳු උපමා ඇත්තාහුය.ඇට කටු සැපීමේ , පෙවීමේ ඵලය තෘෂ්ණාව මිස රසයක් හෝ කුස පිරීමක් නැත්තේය.පීඩාවක්ම වන්නේය. මේ බව ලෝවැඩ සගරාවේ මස් ලේ නැති ඇට බලු ලොව කන්නේ යනුවෙන් දක්වා ඇත.

පඤ්චකාමයෝ මස් වැදැල්ලට බඳු උපමා ඇත්තාහුය.නොයෙක් සතුන්ට ගොදුරු වන්නේය. කාම වස්තුහු ද එසේ ම බහු සාධාරණය. මේ බව දක්වන වීදාගම හිමියෝ

මස් කැටියක් ගත් උකුසෙකු අහයේ ...... යනුවෙන් දක්වයි.

පඤ්ච කාමයෝ තණ සුළගට බඳු උපමා ඇත්තාහුය. තණ සුළකින් ගිනිහුළක් කොට ගත් අයගේ අත දවන්නාසේ පස්කම් රස විඳුම් උතුම් සැපයයි. අල්වා ගත් තැනැත්තා වෙතම දුක් ගින්න පැතිරේ. එය ලෝවැඩ සගරාවේදී,

උබු සුළගට අල්වා ගෙන යන්නේ .... යනුවෙන් දක්වයි

පඤ්ච කාමයෝ දිළිහෙන අගුරු වලකින් නොයෙක් අයුරින් හට ගන්නා ගින්නෙන් දැවීම තැවීම ඇති කරවයි. ඒ නිසා සැප කැමති නුවණැත්තෝ පඤ්ච කාමය දුරින් ම දුරු කරති.
කාමයෝ සිහිනෙන් දක්නා ලද ප්‍රිය වූ ලක්ෂණයක ට බඳු උපමා ඇත්තාහුය. ඉතා සුලු වේලාවකට සැපයයි වැටහෙන අල්ප මාත්‍ර ආස්වාද රස විඳ ගැනීම් ලක්ෂණයක් ඇති මෝහනීය විපතකි.

පංච කාම ආපසු දිමට ඉල්වා ගත් දෙයක ට බඳු උපමා ඇත්තාහුය. ඒ වේලාව ට පමණක් තාවකාලිකව වැටහීමක් ඇති වෙයි. කාමයන්ගේ ස්වභාවය තාවකාලික සැනසීම් මාත්‍රයකි.

පංච කාම සේවනය ගහකින් වැටුණු ගෙඩියකට උපමා කොට ඇත්තාහ. ඒ තුළින් සියලු අංගෝපාංගයන් පලුදු වන, බිඳෙන ස්වභාව ඇති හෙයින් තැලි පොඩිවී නොවටිනා තත්වයට පැමිණෙන්නේ යම් සේ ද පස්කම් රසයට ගිජු වූ තැනැත්තාගේ සිත කය දෙකම පෙලි පීඩාවට ද ගුණ හීන බවට ද පැමිණ පසුතැවිල්ලෙන් දුකින් නොමිදෙන්නේය.

කාමය මස් කපන ආයුධයකට බඳු උපමා ඇත්තේ යයි බුදුරජාණන් වහන්සේ වදාරා ඇත. කඩුවකින් කපා කොටා පෙළන්නාක් මෙන් පීඩාවන පීඩා කරන ස්වභාවයක් එහි ඇති හෙයිනි. එහෙයින් නුවණැත්තේ උපශාන්ත ගුණයෙන් සැරසී ශාන්ත වූ නිවනට යෑම සඳහා උත්සාහ කරන්නේය.

කාමයේ යවුල් වලට උපමා ඇත්තාහ.යවුලෙන් , තියුණු මුවහත් ඇති උල් අවියෙන් ඇන ශරීරය විනිවිද යන සේ තුවාල කරන්නාක් මෙන් කාමය සිත පීඩාවට පත් කොට බලවත් දුක් දීමද ශාරීරික දුක් පීඩා විපත් ද ඇති කරයි.

ඉහත සඳහන් කරන ලද වස්තුකාම ක්ලේශ කාම උග්‍රවිස ඇති සර්පයෙකුගේ හිසකට උපමා කොට ඇත. සර්ප හිස ඇල්ලීම නම් ජීවිතය පිළිගෙන මහත් සැකයට බියට කරුණු වන හෙයිනි.

**පංච කාමය**

අධර්මය බහුල වී යන විට සෑම රටකම,  ජන සමාජයකම ප්‍රකටව දක්නට ලැබෙන්නේ පංච කාම වස්තු ඇති සැටියටත් වඩා අලංකාරයෙන් දක්වා මහත් සැපක් ලෙස ලොවට පෙන්වා, මුලා කොට, එහිම විඳවා විවිධ අනර්ථ සිදු කිරීමයි.

මේ නිසා නුවණැති තැනැත්තා ඇසට, කණට, නාසයට, දිවට, කයට ගෝචර වන රූප ශබ්දාදියට වහල් නොවී, මුලා නොවී විපත්ති පමුණුවා නොගෙන, නුවණින් ඇති තතු දැන, ඉන්ද්‍රිය දමනයෙන් සිල්වත්ව, උතුම් ගුණ ධර්මයන් ගරු කොට, සකසා වඩා වර්ධනය කොට භයංකාර දුකින් මිදී සැපතට පත් වෙයි. අඥානයෝ ඊට වසඟව දාසව විපතෙන් විපතට පැමිණෙයි.

මේ නිසා පංච කාම පිළිබඳ නිමිති නොගෙන ක්‍රියා කිරීම තුළින් සැනසිල්ල උදා කර ගත හැකිය.

මේ අනුව ඔබත් කාමය ගැන වැඩි අවධානයකින් යුක්තව කටයුතු කරමින් භව කතරින් එතෙර වීමට කටයුතු සලසා ගන්න. ඔබට නිවන් මග හෙළිවේවා.

**ඔබ සැමට සම්මා සම්බුදු සරණයි !**